
# යකා පැංචා



ජානකී සූරියආරච්චි

# යකා ආවා



කතාව චිත්‍ර පරිගණක අක්ෂර සහ පරිගණක වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**

**ස්තුතිය !**

මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, “හරිම කරදරේ” කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !

**ජානකී සූරියආරච්චි**
1490/8, හෝකන්දර පාර,
පන්නිපිටිය.
Tel: 94-11-2847438

© ජානකී සූරියආරච්චි

ISBN: 955-1090-17-9
**Book Ref: T/05/119**


# යකා පැංචා

දොලෙන් එහා පුංචි ගමේ
අත්තම්මාගේ නිවසේ
සැමගේ සුරතල් මැද්දේ
පැංචයි පැංචියි හැදුනේ

පැංචා හරි දඟ මල්ලක්
කිසි විට නෑ ඉවසිල්ලක්
සැමදා කරගෙන ලෙල්ලම්
ගුටි නම් කන්නේ ඉල්ලන්

අත්තම්මගෙ හුරතලේලු
හදන්න බැරි ඒ නිසාලු
සීයා වේවැල ගත්තම
පැංච පෙනෙන්නවත් නැලු

අත්තම්මා කොහොම වුණත්
සීයගෙ නෑ ඒ සෙල්ලම්
පැංචට බුරුලට හිටියොත්
බැරිලු හදා ගන්නට නම්



වෙලාවකට සීය හොඳයි
වෙලාවකට සීය වසයි
වේවැල අරගෙන එනකොට
කොච්චි මිරිස් ඊට හොඳයි

දවසක් පැංචා හවසක
හිතුවා හොඳ සෙල්ලමකට
නංගිත් නෑ ළඟ පාතක
මොනව කරන්නද තනියම

දවල්ට කාලා බරටම
මුළු ගෙදරම නිදි හොඳටම
පැංචට නම් මුළු දවසම
සෙල්ලම මිස නෑ වෙන වැඩ

සීයගෙ ලොකු පෙට්ටගමේ
ඇඳුමක් ඇත යකෙක් වගේ
ඇඳගෙන එබුණොත් හනිකේ
පොඩි නංගී දුවයි බයේ



තරුණ කාලෙ එහා ගමේ
සීයා ගම්මඩු නැටුවලු
අත්තම්මගෙ හිත වැටුණොත්
සීය නටනවා දැකලලු

යකා ඇඳුම පෙට්ටගමේ
කොහොමද දැන් අරගන්නේ
සීයා නම් සැප නින්දේ
නැගිටින පාටක් නැත්තේ

සීයා ගොරවන අතරේ
ඇතුළට රිංගා ගත්තේ
වටපිට කවුරුත් නැත්තේ
යකා අරන් පැන ගත්තේ



තත් තරිකිට - තිත් තිරිකිට
යකා පැංච නටයි යසට
අහුවුණොතින් අද සීයට
යකාට පෙන්නයි තරු කැට

පැංචා ඇඳගෙන යකාට
බය කරන්න පොඩි නංගිව
හොරෙන් හොරෙන් කාමරයට
එබුණා බලමින් වටපිට

දොර ළඟ හිටි අපෙ බුල්ටගෙ
වලිගෙ පෑගිලා පැංචට
තරු පෙනිලා කෑ ගහගෙන
බුල්ටා පැන්නා අහකට

"ගඳෑක්-----ගඳෑක්-----ගඳෑ-------ක්"




නින්ද කැඩී අපෙ බුල්ටා
යකා පැංච දැක වෙවුලා
ගොරවා වලිගය පුම්බා
ඇඟට කඩාගෙන පැන්නා

"බා-----ව්  - බව් -  වා-----ව්"

"මේ මොකක්ද මේ වෙන්නේ
බුල්ටා නෑ අඳුනන්නේ"
සෙල්ලම ලෙල්ලම වෙන්නේ
සීයත් දැන් ඇහැරෙන්නේ

දුවල දුවල ගේ මැද්දෙන්
හති දම දම පුටු පෙරලන්
පැංචා එළියට පැන්නේ
කලබල වී පිළිකන්නෙන්




සෙක්කුවෙ බැඳ හිටි හඳයා
යකෙක් දුවල එනු දැකලා
බය වී මර හඬ දීලා
කඹය කඩාගෙන දිව්වා

"උම්බෑ---- බැහෑ----බෑ------"

සෙක්කුවෙ තෙල් උතුරාලා
පිළිකන්නේ බිම හැලිලා
කලබලේට ලිස්සාලා
පැංච වැටුණ ඩොග් ගාලා

බුල්ටා එයි දැන් පස්සෙන්
සීයත් එනවා ඇති දැන්
අහුවුණොතින් නෑ සෙල්ලම්
පැංච දුවයි තව හයියෙන්



මේ මහ කලබල ඇහිලා
මුළු ගෙදරම ඇහැ ඇරිලා
"මහ දවලෙ හොරු පැනලා"
කියමින් බෙරිහන් දුන්නා

"මොකදෑ මේ වී ඇත්තේ
මොනවද හොරු අරගත්තේ"
හැම දෙනාම දුව එන්නේ
සීයා වටකර ගන්නේ

"කාමරයට රිංගාලා
පෙට්ටගම හොරෙන් ඇරලා
ගරා යකා හොරු අරගෙන"
කියමින් සීයා දිව්වා

"ගරා හොරා අද අල්ලා
ගන්නෙමි බෙල්ලෙන් හොල්ලා
උන්දැට මං තඩිබාලා
තියමි දඬු කඳේ ගහලා"






හැමෝම දුව එයි පස්සෙන්
හොරා අල්ලගන්නට දැන්
හොරා දුවයි හති දමමින්
සීයට අහුවෙන්න කලින්

"තිරික්කලේ වැට අයිනේ
කොහෙදෑ දැන් හැංගෙන්නේ"
පැංචා කලබල මැද්දේ
වයිරා පිටටයි පැන්නේ

වයිර බයවෙලා යකාට
තිරික්කලේ ගෙන හනිකට
කලබල වී එක පිම්මට
වයිර දුවයි ගම වටේට



කුලප්පු වී වයිරගොනා
පාර දිගේ ඉගිලෙනවා
ගමේ ඉන්න බලු රෑනම
ඒ පස්සෙන් එළවනවා

පැංචා යයි තිරික්කලේ
බලු රංචුව ඒ පස්සේ
හැම දෙනාම දුව යන්නේ
දුවන පෙරහැරක් වාගේ


"මෙන්න හොරෙක්! හොරගෙඩියෙක්!
පැනලා යයි තිරික්කලෙන්"
බව් වව් වව් - බව් වව් වව්
"අල්ලා ගමු අපි බෙල්ලෙන්"



යකා දැකල කලබලේට
පාර වැරදිලා වයිරට
තප්පුලමින් හති දාගෙන
"පැන්න නේද කුඹුකෙ වෙලට"

තිරික්කලේ එරිල වෙලේ
හෙලවෙන්නත් බෑ වාගේ
ඒ මදිවට බලු රෑනත්
එළවයි පැංචා පස්සේ


බුල්ටා මුල්තැන අරගෙන
ළඟ එයි බලු සේනාවම
කකුල් දෙකට ගෙන වීරිය
පැංචා පැන්නා එළියට



වෙලේ එරිල මඩ නාගෙන
දුවල දුවල දණ ගාගෙන
යකා පැංච හති දාගෙන
නැග ගත්තා දෙල් ගහකට

නගිනකොටම පැංච ගහේ
බුල්ටා එල්ලුනි සරමේ
"අයියෝ මේ මොකද වුණේ"
සරම් පොඩ්ඩ බිම වැටුණේ


හොරාව අල්ලාගන්නට
ගමම ඇවිත් දෙල් ගහ යට
සීයා ඇත මුර දාගෙන
බහින කොටම අල්ලගන්න




සීයා දැකලා පැංචට
දාඩිය දාලා හොඳටම
දෙල් අත්තම හොලවාගෙන
වෙව්ලනවා කිට්කිට්යට

"දඬු කඳේ ගසා තියයිද
චක්කර පාඩම් ගනීද
පස්ස පැත්ත රත් වෙන්නට
පේර කෝටුවෙන් තලයිද"

"බැරියෝ බිම බහින්න නම්
ගහ උඩ දවසම ඉන්නම්"
අල්ලනකොට උඩ අත්තක්
ඔළුව උඩින් දිමි ගොට්ටක්





පැංචා වෙව්ලන තරමට
හෙලවෙනකොට දෙල් අත්තම
ගැලවිලා දිම් ගොට්ටම
කඩා වැටුණා ඔළුව උඩට

"අයියයියෝ මට බැරියෝ
දිමියො ඇඟ පුරා කනවෝ
කිති කව කව උඩ පැන පැන
නහයෙත් යනවා දිමියෝ"

දඟලනකොට අපෙ පැංචා
යකා මූණ ගැලවීලා
දෙල් අත්තෙන් ලිස්සාලා
සීයගෙ ඇඟ උඩ වැටුණා

"කවුදෑ මේ හොරගෙඩියා
කී දේ නාහන දඟයා"
සීයා කන හොල්ලාලා
පැංචා අල්ලා ගත්තා

"අනේ මගේ සුදු පැංචා
දඟ කළාට හොඳ කොල්ලා!"
කියා පැනල අත්තම්මා
පැංචා බේරා ගත්තා

බය වී අඬමින් පැංචා
වැඳල සමාවත් ගත්තා
ආයෙත් නම් මේ වාගේ
දඟ කරන්නෙ නෑ කීවා

ගහෙන් වැටිල මඩ නාලා
හොඳටම දිමියොත් කාලා
පැංච අඬන හැටි දැකලා
සීයාටත් දුක හිතිලා

"පැංච පුතේ මේ අහන්න
පුංචි කාලෙ දඟ කරන්න
ඒත් හොඳට හිතට ගන්න
පරෙස්සමින් වැඩ කරන්න"



| | |
|---|---|
| ලෙල්ලම් | -සෙල්ලමක් නිසා සිදුවන වැරැද්ද |
| පෙට්ටගම | -වටිනා භාණ්ඩ අසුරා තබන, දැවයෙන් සාදන ලද පෙට්ටියක් වැනි ගෘහ භාණ්ඩයකි. |
| ගම්මඩු | -ගම්වල ගොයම් කැපීමෙන් පසු වාර්ෂිකව සිදු කරන දේව කන්නලව්ව (ශාන්ති කර්මය) |
| ගරා යකා | -දහඅට සන්නියෙහි එන යක්ෂයන්ගෙන් කෙනෙකි |
| තත් තරිකිට<br>තිත් තිරිකිට | -බෙර පදයකි |
| පිළිකන්න | -ගැමි නිවසක කුස්සිය පසුපස ආශ්‍රිත ප්‍රදේශය. |
| සෙක්කුව | -තෙල් සිඳීම සඳහා පාවිච්චි කරන, ගවයෙකු යොදා ක්‍රියාකරවන, කළු ගලින් නිර්මාණය කල උපකරණයකි. ගවයා එය වටා ගමන් කරනවිට පොල් මිරිකී තෙල් ඉවතට එයි. |
| තිරික්කලය | -ගමන් යාමට පාවිච්චි කරන ලද රෝද දෙකකින් යුතු හරකා බැඳි කරත්තයකි. |
| කුලප්පු වීම | -හරක් අලි අශ්ව ආදී සතුන් කලබලයට පත් වීම |
| තප්පුලනවා | -හරකුන්ගේ ශබ්ද නගා හඬගෑම |
| දඬුකඳ | -ගමෙහි ප්‍රධානියා විසින් යම් වරදකරුවෙකුට දඬුවම් කිරීම සඳහා පාවිච්චි කරන ලද, දැව උපකරණයකි. පාදයෙහි වළලුකර මෙම උපකරණයෙහි තබා විලංගු දමනු ලැබේ. |